# 2006 පළමු කාර්තුව තුල ශ්‍රී ලංකාවේ රැකියා නියුක්තිය සහ රැකියා වියුක්තිය පිළිබඳ තොරතුරු කෙටියෙන්
## ( ශ්‍රී ලංකාවේ ශ්‍රමබල සමීක්ෂණය ආශ්‍රයෙනි )

**රැකියා නියුක්තිකයින් යනු : වැටුප් හෝ ලාභ පිණිස හෝ පවුලට ආදායමක් ලැබීම සඳහා හෝ කිසියම් වැඩක නියැලුනු පුද්ගලයින් වේ.**

☞ **2006 පළමු කාර්තුව තුල වාර්තා වූ රැකියා නියුක්තිකයින් සංඛ්‍යාව 7081435 කි.**




රැකියා නියුක්ත වුවන් ගෙන් **සේවා** අංශයන්ට සම්බන්ධ රැකියාවල යෙදෙන්නන් වැඩිම ප්‍රතිශතයක් වාර්තා වේ. (41%)

**කර්මාන්ත** අංශයේ රැකියා කරන්නවුන් වාර්තා වන්නේ 26%ක් වැනි ප්‍රතිශතයකිනි.

**කෘෂිකර්ම** අංශයේ සේවා නියුක්තිකයින්ගේ වැඩිවීම පසුගිය වසරට වඩා ප්‍රතිශත ඒකක 2.4ක් ලෙස වාර්තා වීමද විශේෂත්වයකි.

**රැකියා විරහිත පුද්ගලයින් යනු : රැකියාවක් සොයමින් සිටි හා රැකියාවක් බලාපොරොත්තුව රැකියාවක් නොමැතිව සිටි පුද්ගලයින් වේ.**

☞ **2006 පළමු කාර්තුව අවසානයේ රැකියා විරහිත පුද්ගලයින් සංඛ්‍යාව 546326 කි.**

**විරැකියා අනුපාතය යනු : රැකියා විරහිත පුද්ගලයින් සංඛ්‍යාව ශ්‍රමබලකායට ඇති අනුපාතයේ ප්‍රතිශතය වේ.**

☞ **2006 පළමු කාර්තුව අවසානයේ විරැකියා අනුපාතය 7.2% කි.**

මෙයින් අදහස් වන්නේ ආර්ථිකය සවිබල ගන්වන සහ සවිබල ගැන්විය හැකි, ඒ සඳහා හැකියාවක්, වුවමනාවක් මෙන්ම බලාපොරොත්තුවක්ද ඇති වයස අවුරුදු10 ට සහ ඊට වැඩි සමස්ත ජනගහනයෙන් 7.2% ක් රැකියා විරහිත පුද්ගලයින් බවයි.

- ✍ **මෙතෙක් ශ්‍රී ලංකාවෙන් වාර්තා වූ අවම විරැකියා අනුපාතය මෙවර වාර්තා වේ.**
- ✍ විශේෂයෙන් ස්ත්‍රීන්ගේ විරැකියා අනුපාතය පසුගිය වසරේ සිට මේ වසර වන විට ප්‍රතිශත ඒකක 1.8 කින් අඩු වී තිබේ.
- ✍ 2002 වසරේ සිට 2006 ආරම්භය වන විට විරැකියා අනුපාතය 8.8 සිට 7.2 තෙක් ප්‍රතිශත ඒකක 1.6 කින් අඩු වීමද කැපී පෙනෙන ලක්ෂණයකි.

කෙසේ වෙතත් වයස අවුරුදු 20 - 24 වියෙහි පසුවන තරුණ තරුණියන්ගේ විරැකියා අනුපාතය තවමත් 22.4% ක් වන සාපේක්ෂ **ඉහළ** මට්ටමක පවතී. නමුත් 2005 වසරේදී මෙම අගයද 24.6% ක්වද පැවතුණි.

☞ උසස් පෙළ හා ඊට වැඩි සුදුසුකම් ඇති අයගේ විරැකියා අනුපාතය 12.1% කි.එය පසුගිය වසරට වඩා ප්‍රතිශත ඒකක 1.7 ක අඩුවීමකි. එනම්, පසුගිය වසර කිහිපය හා සසඳන විට ඉහළ අධ්‍යාපන සුදුසුකම් සහිත අයගේ විරැකියාව ක්‍රමයෙන් **අඩුවන** ප්‍රවනතාවක් දක්නට ලැබේ.

**සැ.යු. :**

1. **සංසන්දනාත්මක අවධානයට :**

   පසුගිය වසර කිපය තුල ශ්‍රී ලංකාවේ ශ්‍රමබල සමීක්ෂණයෙන් වාර්තා වූ ශ්‍රමබල තොරතුරු සංක්ෂිප්ත වාර්තාව

2. **සටහන :**

   2006 පළමු කාර්තුව සඳහා මෙම තොරතුරු ඇස්තමේන්තු කිරීමේදී උතුරු හා නැගෙනහිර පළාත් ඇතුලත්ව නැති බව සලකන්න.


**විමසීම් :** ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, නියැදි සමීක්ෂණ අංශය,
දුරකථන 2681579, 2691624. ඊමේල්:sample.survey @ statistics.gov.lk
අන්තර් ජාලය : www.statistics.gov.lk